රාජ්‍ය මූල්‍ය අංශය

7 වැනි සංඛ්‍යා සටහන

මධ්‍යම රජයේ ණය (අ)

වටිනාකම රුපියල් මිලියන

වර්ෂය (ආ)	දේශීය ණය					විදේශීය ණය (ඇ) (ඈ)	එකතුව (ඉ)	ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඊ)		
	භාණ්ඩාගාර බිල්පත් (ඇ)	රුපියල් ණය	භාණ්ඩාගාර බැඳුම්කර (ඈ) (ඉ)	අනෙකුත්	එකතුව (ඉ)			දේශීය	විදේශීය	එකතුව
1950	79	436	-	14	529	125	654	13.7	3.2	16.9
1951	30	582	-	14	626	125	751	13.6	2.7	16.3
1952	93	684	-	75	852	192	1,044	18.9	4.3	23.2
1953	184	731	-	129	1,044	205	1,249	23.2	4.6	27.8
1954	105	782	-	66	953	211	1,164	20.1	4.4	24.5
1955	60	829	-	-	889	232	1,121	17.0	4.4	21.4
1956	68	882	-	-	950	258	1,208	18.6	5.1	23.7
1957	65	962	-	105	1,132	278	1,410	21.8	5.3	27.1
1958	140	1,007	-	91	1,238	293	1,531	22.5	5.3	27.9
1959	320	1,102	-	138	1,560	307	1,867	24.3	4.8	29.1
1960	550	1,217	-	170	1,937	345	2,282	28.9	5.1	34.0
1961	750	1,397	-	198	2,345	407	2,752	34.1	5.9	40.0
1962	1,000	1,515	-	179	2,694	412	3,106	38.7	5.9	44.6
1963	1,125	1,684	-	222	3,031	489	3,520	41.1	6.6	47.7
1964	1,250	1,909	-	216	3,375	549	3,924	43.3	7.0	50.4
1965	1,300	2,150	-	246	3,696	739	4,435	45.7	9.1	54.9
1966	1,425	2,475	-	295	4,195	1,074	5,269	50.3	12.9	63.2
1967	1,500	2,785	-	298	4,583	1,376	5,959	50.7	15.2	65.9
1968	1,750	3,118	-	329	5,197	1,578	6,775	48.5	14.7	63.2
1969	1,750	3,409	-	354	5,513	1,800	7,313	47.1	15.4	62.5
1970	1,950	3,925	-	420	6,295	2,394	8,689	46.1	17.5	63.6
1971	2,025	4,512	-	446	6,983	2,795	9,778	49.7	19.9	69.6
1972	2,325	5,103	-	498	7,926	2,936	10,862	52.0	19.3	71.2
1973	2,250	5,812	-	522	8,584	3,705	12,289	46.6	20.1	66.8
1974	2,250	6,591	-	604	9,445	2,859	12,304	39.7	12.0	51.8
1975	2,350	7,560	-	949	10,859	3,705	14,564	40.9	13.9	54.8
1976	2,700	9,001	-	990	12,691	4,968	17,659	42.0	16.4	58.5
1977	2,500	10,391	-	1,501	14,392	10,593	24,985	39.5	29.1	68.6
1978	2,635	12,049	-	1,684	16,368	14,583	30,951	38.4	34.2	72.5
1979	3,000	14,929	-	1,705	19,634	15,840	35,474	37.5	30.2	67.7
1980	9,800	17,611	-	1,659	29,070	22,276	51,346	43.7	33.5	77.2
1981	13,920	20,025	-	1,573	35,518	29,172	64,690	41.8	34.3	76.1
1982	17,320	25,800	-	2,147	45,267	35,267	80,534	45.6	35.5	81.2
1983	17,400	31,953	-	2,416	51,769	46,688	98,457	42.6	38.4	81.0
1984	14,860	33,228	-	3,564	51,652	53,681	105,333	33.6	34.9	68.5
1985	22,280	36,570	-	3,761	62,611	67,673	130,284	38.6	41.7	80.2
1986	26,173	39,130	-	4,196	69,499	86,208	155,707	38.7	48.0	86.8
1987	29,850	44,957	-	4,190	78,997	111,812	190,809	40.2	56.8	97.0
1988	43,700	49,797	-	5,099	98,596	125,657	224,253	44.4	56.6	101.0
1989	57,246	54,217	-	6,099	117,562	156,298	273,860	46.7	62.0	108.7
1990	67,968	54,677	-	11,251	133,896	176,883	310,779	41.6	55.0	96.6
1991	72,968	66,823	-	12,328	152,119	214,579	366,698	40.9	57.6	98.5
1992	87,096	69,180	-	13,744	170,020	235,539	405,559	40.0	55.4	95.4
1993	97,196	105,707	-	10,782	213,685	270,224	483,909	42.8	54.1	96.9
1994	98,896	137,554	-	12,669	249,119	301,812	550,931	43.0	52.1	95.1
1995	113,771	157,928	-	17,711	289,410	346,286	635,696	43.3	51.9	95.2
1996	124,996	205,975	-	25,731	356,703	359,685	716,388	46.4	46.8	93.3
1997	114,996	239,475	10,000	23,269	387,740	376,331	764,071	43.6	42.3	85.8
1998	119,996	250,570	48,915	43,945	463,426	461,273	924,699	45.5	45.3	90.8
1999	124,996	262,056	104,867	51,546	543,465	507,866	1,051,331	49.1	45.9	95.1
2000	134,996	263,888	204,124	73,652	676,660	542,040	1,218,700	53.8	43.1	96.9
2001	170,995	292,813	229,174	122,983	815,965	636,741	1,452,706	58.0	45.3	103.3
2002	210,995	287,701	347,128	102,562	948,386	721,957	1,670,343	60.0	45.6	105.6
2003	219,295	248,414	487,504	69,153	1,024,366	843,882	1,868,248	56.2	46.3	102.5
2004	243,886	164,758	647,746	91,396	1,147,786	996,138	2,143,924	54.9	47.6	102.5
2005	234,174	140,563	755,966	139,415	1,270,119	956,620	2,226,739	51.8	39.0	90.8
2006	257,732	116,713	890,369	218,813	1,483,627	1,103,418	2,587,045	50.5	37.5	88.0
2007	307,012	131,509	1,023,249	257,825	1,719,595	1,326,487	3,046,082	47.9	37.1	85.1
2008	402,600	130,009	1,286,375	325,641	2,144,625	1,448,734	3,593,359	48.5	32.8	81.5
2009	441,032	112,292	1,517,909	334,119	2,405,352	1,760,467	4,165,819	49.7	36.5	86.2
2010	514,442	87,709	1,648,284	319,624	2,570,059	2,024,583	4,594,642	38.8	30.5	69.3
2011	590,885	61,961	1,823,648	331,988	2,808,482	2,329,280	5,137,762	37.5	31.1	68.6
2012	629,070	58,386	2,177,892	450,303	3,315,651	2,767,299	6,082,950	36.9	30.8	67.7
2013	700,137	55,518	2,548,323	624,810	3,928,788	2,960,424	6,889,212	39.5	29.8	69.3
2014	694,767	55,518	2,940,017	683,444	4,373,746	3,113,116	7,486,862	40.6	28.9	69.5
2015	658,240	24,088	3,401,211	971,620	5,055,159	3,544,031	8,599,190	43.7	30.6	74.3
2016	779,581	24,088	3,806,353	823,051	5,433,073	4,045,796	9,478,869	42.4	31.6	74.0
2017	697,154	24,088	3,892,408	1,050,565	5,664,215	4,718,618	10,382,832	39.4	32.8	72.2
2018	746,887	24,088	4,197,323	1,102,703	6,071,001	5,959,547	12,030,548	39.5	38.8	78.4
2019	873,943	24,088	4,606,232	1,325,997	6,830,260	6,201,283	13,031,543	42.9	39.0	81.9
2020 (උ)	1,620,705	24,088	5,713,300	1,706,975	9,065,068	6,052,179	15,117,247	57.8	38.6	96.5
2021	2,270,508	24,088	6,966,218	1,836,410	11,097,223	6,516,958(ඌ)	17,614,181	63.1	37.0	100.1
2022 (එ)(ඒ)	4,113,907	24,088	8,709,057	2,186,824 (ම)	15,033,876 (ම)	12,458,155(ඌ)(ම)	27,492,031	62.3 (ම)	51.6 (ම)	113.8 (ම)(ම)

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, 2019 වසරේ සිට අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වේරීත්ව බැඳුම්කර දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.

(ආ) 1950 සිට 1973 දක්වා වර්ෂවල පෙන්වා ඇත්තේ සැප්තැම්බර් මස අවසානයට පැවති තේරය වන අතර, 1973 සිට දක්වා ඇත්තේ දෙසැම්බර් මස අවසානයට වූ තේරය වේ.

(ඇ) 2008 සිට විදේශීය ආයෝජකයින් වෙත නිකුත් කළ හාණ්ඩාගාර බිල්පත් දේශීය ණයවලින් ඉවත් කර ඇති අතර ඒවා විදේශ ණයවලට එකතු කර ඇත.

(ඈ) 2007 සිට විදේශීය ආයෝජකයින් වෙත නිකුත් කළ හාණ්ඩාගාර බැඳුම්කර දේශීය ණයවලින් ඉවත් කර ඇති අතර ඒවා විදේශ ණයවලට එකතු කර ඇත.

(ඉ) 2003 නොවැම්බර් මාසයේ දී ස.ජනා.ස. වෙත නිකුත් කරන ලද රුපියල් මිලියන 4,397ක් වටිනා හාණ්ඩාගාර බැඳුම්කර(2016 නොවැම්බර් 14 දින කල්පිරිණි.), 2013 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකන් ගුවන් සේවයට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125ක් වටිනා හාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරිණි.) සහ 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා බණිජ තෙල් නිගිත සංස්ථාව මෙනුවෙන් නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා හාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් සහ 2022 ජනවාරි 01 දින රුපියල් මිලියන 25,217 ක් වටිනා බැඳුම්කර කල් පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 31,446කි.) ඇතුළත් වේ

(ඊ) 2010 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත.

(උ) මුදල් අමාත්‍යාංශයට අනුව 2020 වසරේ දී සිදු කළ 2019 වසරට අදාළ නොපියවූ ණය ගෙවීම් 2019 වසරේ අයවැය ණය මූල්‍යනය කිරීමට ඇතුළත් කළහොත් 2019 වසරේ අවසානයට මධ්‍යම රජයේ ණය සංඛ්‍යාලේඛන ඉහළ යා හැකිය. කෙසේ වෙතත් එවැනි ගැළපීමක් මගින් 2020 වසර අවසානයට පවත්නා නොපියවූ මධ්‍යම රජයේ ණය සඳහා බලපෑමක් ඇති නොවේ.

(ඌ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේඛම්-ණය වර්ගීකරණ හා කළමණාකරණ පද්ධතියෙන් 2023 මාර්තු 09 සහ 10 වැනි දින ලබා ගත් දත්ත පදනම්ව 2021 සහ 2022 වසර වලට අදාලව විදේශීය ණය දත්ත සහ විදේශීය ණය වර්ගීකරණය සකස් කර ඇත.

(එ) තාවකාලික

(ඒ) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කණ්ඩායම ප්‍රාග්ධනයට එකතු කළ යුතු ගෙවීමට නියමිත පොළි ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව නොගෙවූ ණය පොළි ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.

(ම) 2022 දෙසැම්බර් මස සිට බල පැවැත්වෙන පරිදි මධ්‍යම රජයේ නොපියවූ ණය යටතට අවගෝෂණය කරන ලද ලංකා බණිජ තෙල් නිගිත සංස්ථාව යටතේ පැවති රුපියල් මිලියන 884,093.4ක වටිනාකමින් යුතු භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබා ගත් නොපියවූ ණය ඇතුළත් වේ.

(ඹ) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් නොවුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය තිහිපයකට අදාළ හොගෙවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.

මූලයන්: මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

අරමුදලෙහි මුළු වටිනාකම 2021 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 3,166.1ට සාපේක්ෂව 2022 වසර අවසානය වන විට සියයට 9.3ක වර්ධනයක් පෙන්නුම් කරමින්, රුපියල් බිලියන 3,459.9ක් දක්වා රුපියල් බිලියන 293.7කින් ඉහළ ගියේය. සාමාජිකයන්ගේ ශුද්ධ දායක මුදල් ලැබීම්වල (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) මෙන්ම අරමුදල් ආයෝජනය තුළින් උපයාගත් ආදායම්වල සමස්ත ප්‍රතිඵලය මෙම වර්ධනයට හේතු විය. අරමුදල, සාමාජිකයන් වෙත වූ මුළු වගකීම 2022 වසර අවසානය වන විට රුපියල් බිලියන 3,380.6ක් වූ අතර, එය 2021 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 3,066.9ට සාපේක්ෂව සියයට 10.2ක වර්ධනයකි. 2022 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් සියයට 17.4කින් රුපියල් බිලියන 194.6ක් දක්වා වර්ධනය වූ අතර සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන් හට සිදු කළ සමස්ත ප්‍රතිලාභ ගෙවීම් රුපියල් බිලියන 163.0ක් වූ අතර, එය 2021 වසරට සාපේක්ෂව සියයට 37.9ක වර්ධනයකි. ඒ අනුව, 2022 වසරට අදාළ ශුද්ධ දායක මුදල් ලැබීම් පෙර වසරේ පැවති රුපියල් බිලියන 47.5ට සාපේක්ෂව රුපියල් බිලියන 31.6ක් විය. අරමුදලෙහි ශුද්ධ ආදායම පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 299.1ට සාපේක්ෂව සියයට 11.7කින් පහළ යමින් 2022 වසර අවසානයේ දී රුපියල් බිලියන 264.1ක් විය. මෙයට ප්‍රධානතම හේතුව වූයේ පෙර වසරේ ලැයිස්තුගත කොටස් මත පැවති උපලබ්ධි නොවූ වෙළඳපොළ මිලට අගය කළ ලාභය වූ රුපියල් බිලියන 41.8ට සාපේක්ෂව 2022 වසරේ දී ලැයිස්තුගත කොටස් මත උපලබ්ධි නොවූ වෙළඳපොළ මිලට අගය කළ අලාභය රුපියල් බිලියන 40.9ක් වීමයි.

8.16 සංඛ්‍යා සටහන

සේවක අර්ථසාධක අරමුදලේ කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය

අයිතමය	2018	2019	2020	2021	2022(අ)
අරමුදලේ සමස්ත වටිනාකම (රු. බිලියන)	2,289.4	2,540.4	2,824.3	3,166.1	3,459.9
සාමාජිකයන් සඳහා වූ මුළු වගකීම (රු. බිලියන)	2,254.2	2,497.6	2,767.8	3,066.9	3,380.6
මුළු දායක මුදල් ලැබීම් (රු. බිලියන)	145.0	157.2	150.7	165.7	194.6
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන)	108.0	126.3	109.7	118.2	163.0
ශුද්ධ දායක මුදල් ලැබීම් (රු. බිලියන)	37.0	30.9	41.0	47.5	31.6
සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොළී අනුපාතිකය (%)	9.50	9.25	9.00	9.00	9.00
මුළු සාමාජික ගිණුම් (මිලියන)	18.7	19.4	19.8	20.3	20.4
සක්‍රිය සාමාජික ගිණුම් (මිලියන)	2.9	2.9	2.6	2.5	2.4

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අරමුදලෙහි සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) 2021 වසරේ පැවති රුපියල් බිලියන 3,173.3ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 3,466.5ක් දක්වා සියයට 9.2කින් වර්ධනය විය. අරමුදලෙහි ආයෝජන ප්‍රතිපත්තිය, අරමුදලෙහි සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, සාමාජිකයින්ට අවදානම්වලට ගළපන ලද ප්‍රශස්ත ප්‍රතිලාභයක් ලබා දීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක කෙරුණු අතර එහිදී සාමාජිකයන්ට ප්‍රතිලාභ ගෙවීම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සපුරාගැනීම සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව පවත්වා ගැනීම ද සලකා බලනු ලැබීය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට අරමුදලෙහි සමස්ත ආයෝජන කළඹෙන් සියයට 96.9ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, සමාගම් කොටස්වල සියයට 2.3ක් ද සාංගමික ණයකරවල සියයට 0.7ක් ද ඉතිරි සියයට 0.1 ප්‍රතිවිකුණුම් ගිවිසුම්වල ද ආයෝජනය කර තිබුණි.

අරමුදලෙහි සමස්ත ආයෝජන ආදායම 2022 වසරේ දී රුපියල් බිලියන 315.9ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 342.2 හා සැසඳීමේ දී සියයට 7.7ක පහත වැටීමකි. පොලී ආදායම, අරමුදලෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර එය 2021 වසරේ උපයන ලද රුපියල් බිලියන 293.7ට සාපේක්ෂව 2022 වසරේ දී රුපියල් බිලියන 349.3ක් දක්වා සියයට 18.9කින් වර්ධනය විය. 2022 වසරේ ලාභාංශ ආදායම 2021 වසරේ දී වූ රුපියල් බිලියන 6.7ට සාපේක්ෂව සියයට 12.6කින් රුපියල් බිලියන 7.5ක් දක්වා වර්ධනය විය. පෙර සඳහන් කළ පරිදි, 2021 වසරේ දී ලැයිස්තුගත කොටස් මත පැවති උපලබ්ධි නොවූ වෙළඳපොළ මිලට අගය කළ ලාභය රුපියල් බිලියන 41.8ක් ලෙස වාර්තා වූ අතර 2022 වසරේ දී එය රුපියල් බිලියන 40.9ක අලාභයක් ලෙස දැක්විණි.

2022 වසරේ දී අරමුදලේ සමස්ත දළ ආදායම රුපියල් බිලියන 316.2ක් ලෙස ඝටනන් වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 342.4 හා සැසඳීමේ දී සියයට 7.6ක අඩු වීමකි. මෙහෙයුම් වියදම් සහ බදු වියදම් සඳහා වෙන් කිරීම් කළ පසු 2022 වසර සඳහා ශුද්ධ ලාභය රුපියල් බිලියන 264.1ක් වන අතර එය 2021 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 299.1ට සාපේක්ෂව සියයට 11.7ක අඩුවීමකි. ඒ අනුව, 2022 වසරේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාන්‍ය ආයෝජනය මත ප්‍රතිලාභය සියයට 9.96ක් විය. භාණ්ඩ හා සේවාවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබියදීත්, 2022 වසරේ දී අරමුදලේ දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අනුපාතය